# 13 ශ්‍රේණිය දේශපාලන විද්‍යාව - බහුවරණ ප්‍රශ්න පත්‍රය

01.)දේශපාලන විද්‍යාව සම්බන්ධ වැරදි සහගත කියමන වන්නේ,

1.දේශපාලන විද්‍යාව යනු පැරණිතම ශාස්ත්‍රීය ශික්ෂණයකි.
2.මෙහි ග්‍රීක සම්ප්‍රදායේ ආරම්භයන් ප්ලේටෝ හා ඇරිස්ටෝටල්ය.
3.මෙය ක්‍රි.පූ.7 වන සියවසේ ආරම්භ වූවකි.
4.පැරණි දේශපාලන විද්‍යාවේ පියා ග්‍රීක ජාතික ඇරිස්ටෝටල්ය.
5.ප්ලේටෝ විසින් රචිත සමූහාණ්ඩුව කෘතිය මේ සඳහා වැදගත් විය.

02.)දේශපාලනය හා දේශපාලන විද්‍යාව යන්නෙහි නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A.දේශපාලනය කිරීම යනු මැතිවරණ ආදියට සහභාගී වීමයි.
B.දේශපාලනය හැදෑරීම යනු ශාස්ත්‍රීය ලෙස හැදෑරීමයි.
C.යමෙක් දේශපාලන පක්ෂවල ක්‍රියාකාරී වීම දේශපාලනය කිරීමයි.
D.දේශපාලනය කිරීමට දේශපාලනය පිළිබඳ ශාස්ත්‍රීය ලෙස හදාරා තිබිය යුතුය.
E.කෙනෙකු දේශපාලනය ප්‍රායෝගිකව නොකළත් දේශපාලනය හැදෑරිය හැකිය.

1.)ABCD 2.)BCDE 3.)ACDE 4.)ABDE 5.)ABCE

03.)දාර්ශනික - ප්‍රතිමානීය ප්‍රවේශයට සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

1. මෙහි පුරෝගාමීන් ප්ලේටෝ හා ඇරිස්ටෝටල්ය.
2. සීසරෝ,ගාස්මීන් යුරෝපා දේශපාලන චින්තකයින්ය.
3. සත්‍ය වශයෙන් පවතින තත්වයක් නොව පැවතිය යුතුයැයි සිතින් මවා ගන්නා ලද තත්වයකි.
4. මහත්මා ගාන්ධි 20 වන සියවසේ චින්තකයෙකි.
5. මෙය සැබෑ ලෝකයේ ක්‍රියාත්මක කිරීම ඉතා සාර්ථකය.

04.)ස්ත්‍රීවාදය ප්‍රවේශය පිළිබඳ වැරදි සහගත ප්‍රකාශය තෝරන්න.

1.මෙය 1970 දශකයේදී ඇති වූවකි.
2.මෙය සාම්ප්‍රදායිකව ප්‍රතිමානීය ප්‍රවේශයට සමාන වූවකි.
3.ස්ත්‍රී පුරුෂ සමාජභාවය මෙහි සංකල්පයකි.
4.පුරුෂාධිපත්‍ය මෙහි සංකල්පයකි.
5.මේ මගින් දේශපාලනය යන සංකල්පයේ අර්ථය පවා වර්ධනය විය.

05.)දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍රයන් ඇතුළත් ප්‍රකාශ කාණ්ඩ තෝරන්න.

(A)දේශපාලන දර්ශනය (B) දේශපාලන මතවාද (C)පුරවැසියන්ගේ ආගමික සදාචාරය (D) දේශපාලන න්‍යාය (E) දේශපාලන ආයතන

06.)දේශපාලන පක්ෂ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ ,

1.නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ නැතුව බැරි අංගයකි.
2.19 වන සියවසේ මැදභාගයේ යුරෝපයේ හා ඇමරිකාවේ බිහිවිය.
3.පක්ෂවල අරමුණ ආණ්ඩුබලය ලබා ගැනීමයි.
4.දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයට පටහැනි වූවකි.
5.මැතිවරණ මගින් ආණ්ඩු බලය ලබා ගැනීමට වෙහෙසේ.

07.)දේශපාලන පක්ෂ වර්ගීකරණයට අදාළවන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(A) කේඩර පක්ෂ හා බහුජන පක්ෂ

(B) මහජන මතය නියෝජනය කරන මතය හා මහජන මතය හැඩගස්වන පක්ෂ

( C ) සාමාජික කාඩ්පත හිමි පක්ෂ හා විප්ලවකාරී පක්ෂ

(D) ව්‍යවස්ථාවාදී පක්ෂ හා විප්ලවකාරී පක්ෂ

(E) වාමාංශික පක්ෂ හා දක්ෂිණාංශික පක්ෂ

1.)ABCD 2.)BCDE 3.)ACDE 4.)ABDE 5.)ABCE

08.)පක්ෂ ක්‍රම සඳහා අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(A) තනි පක්ෂ ක්‍රමය (B) ද්වි පක්ෂ ක්‍රමය ( C ) අධිපති තනි පක්ෂ ක්‍රමය

(D ) අධිපති ද්වි පක්ෂ ක්‍රමය ( E ) කොමියුනිස්ට් පක්ෂ ක්‍රමය

1.)ABCD 2.)BCDE 3.)ACDE 4.)ABDE 5.)ABCE

09.)රාජ්‍ය හා එහි භූමිකාව පිළිබඳව නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(A) රාජ්‍යයේ කාර්යයන් ව්‍යවස්ථාදායක,විධායක,අධිකරණ ලෙස අංශ තුනකි.

(B) ව්‍යවස්ථාදායකය යුක්තිය පසිඳලීම සිදු කරයි.

( C ) විධායකය නීති ක්‍රියාත්මක කරයි.

(D ) රාජ්‍ය මනුෂ්‍ය සමාගමකි යන්න ඇරිස්ටෝටල්ගේ අදහසයි.

( E ) ආර්ථිකය පරිපාලනය හා මෙහෙයවීම රාජ්‍යයේ කාර්යයකි.

1.)ABCD 2.)BCDE 3.)ACDE 4.)ABDE 5.)ABCE

10.) නූතන භෞමික රාජ්‍යයට අදාළ අංගයක් නොවන්නේ,

(A)නිශ්චිත දේශසීමා (B)ජාතික පදනම (C )ආණ්ඩුව ( D) ස්වාධිපත්‍ය (E )ජාතික ව්‍යවසාය

1.)ABCD 2.)BCDE 3.)ACDE 4.)ABDE 5.)ABCE

11.) රාජ්‍ය මාදිලි සහ වර්ගීකරණයක් නොවන්නේ,

1.කලාපීය හා ගෝලීය රාජ්‍ය 2.ගෝත්‍රික රාජ්‍ය 3.ග්‍රීක නාගරික රාජ්‍ය 4.රාජාණ්ඩු 5.ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය

12.) රාජ්‍ය හා ස්වාධිපත්‍ය පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,

1.ස්වාධිපත්‍ය රාජ්‍යයට හා වෙනත් විවිධ සමාගම්වලට ද හිමි වේ.
2.ස්වාධිපත්‍ය යනු උත්තරීතර යන්නයි.
3.මෙහි නිර්මාතෘවරයා ජීන් බොඩෑන්ය.
4.අභ්‍යන්තර හා බාහිර ලෙස කොටස් දෙකකට බෙදේ.
5.ස්වාධිපත්‍ය බෙදිය නොහැකි රාජ්‍යයට පමණක් හිමිවන්නකි.

13,)ෆැසිස්ට් රාජ්‍ය පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ,

1. 1920-1930 දශකවලදී බිහි වූවකි.
2. ඉතාලිය හා ජර්මනිය පළමු රටවල් දක්වයි.
3. හිට්ලර් හා මුසෝලිනී ප්‍රථම ෆැසිස්ට් පාලකයන් විය.
4. මිනිස් අයිතිවාසිකම් හා නිදහස අගය කරයි.
5. රාජ්‍ය සර්ව බලධාරී වේ යන්න තේමාවයි.

14.)ලිබරල් වාදය සම්බන්ධ තෝමස් හොබ්ස්ට වැරදි ප්‍රකාශය තෝරන්න.

1. ඔහු එංගලන්ත ජාතිකයෙකි.
2. ලිබරල්වාද චින්තකයෙකු නොවේ.
3. 1652 දී leviathan කෘතිය රචනා කරන ලදී.
4. පුද්ගලයා තාර්කික බුද්ධියක් හිමි ස්වායත්ත පුද්ගලයෙක් බව පවසන ලදී.
5. ග්‍රීක යුගයට අයත් චින්තකයෙකි.

15.)ලිබරල්වාදය පිළිබඳ ජෝන් ලොක්ට වැරදි ප්‍රකාශය තෝරන්න.

1.මොහු ප්‍රධාන ලිබරල්වාදී චින්තකයෙකි.
2.ප්‍රංශ ජාතිකයෙකු වූ මොහු ක්‍රි.පූ.4 වන සියවසට අයත් වූවෙකි.
3.1690 දී ප්‍රධාන කෘතියක් රචනා කළහ.
4.ආණ්ඩුව පිළිබඳ රචනා දෙකක් ඔහුගේ කෘතියයි.
5.දැඩි රාජාණ්ඩු විරෝධියෙකි.

**සැකසුම - තිළිණ ජයවර්ධන මයා,**

**ර/මල්වල ම.වි.**